ශීර්ෂය 102 මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 102 - මුදල් ,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් ,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 ජූනි 12 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 04 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මුදල් ,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව මුදල් ,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ,මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය විෂයයන් 06කට අදාලව 2024 වර්ෂයේදී වෙන් කරන ලද එකතුව රු. මිලියන 101 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.	මෙම වැය විෂයන් සඳහා අපේක්ෂා කළ පරිදි වියදම් ඇතිනොවීම නිසා මෙම වැය විෂයන්ගේ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු වීම.
(ආ)	සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 19 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙන් කරන ලද එකතුව රු. මිලියන 140 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 112 ක් උපයෝජනය කිරීමෙන් තොරව සැලකිය යුතු ප්‍රමාණයකින් ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක් ගෙන තිබුණි.	මෙම වැය විෂයන් සඳහා අපේක්ෂා කළ පරිදි වියදම් ඇතිනොවීම සහ වියදම් කළමනාකරණය කිරීම නිසා මෙම වැය විෂයන්ගේ ඉතිරිවීම් සිදුවී තිබුණි.	-එම-
(ඇ)	වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබු අංක 102-1-1-1408 දරන වැය විෂයය සඳහා රු.මිලියන 17 ක් මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.	මෙහෙයුම් කල් බදු ක්‍රමය මත ලබාගත් වාහන සඳහා අමාත්‍ය කාර්යාලයට අදාලව වියදම් එම ව්‍යාපෘතිය යටතේ දැරීම සඳහා ඉදිරිපත් වීම නිසා 102-01-02-1408 වැය විෂය මඟින් අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය මු.රෙ 66 මඟින් සලසා ගැනීමට කටයුතු කර තිබුණි.	-එම-

(ඇ)	මූලධන වැය විෂයයන් 2 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ එකතුව රු.200,000 ට අමතරව, එකතුව රු. මිලියන 3 ක පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණු අතර, එය එම වැය විෂයයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 1,500 ක් හා සියයට 1,610 ක් වී තිබුණි. එසේ වුවද, එක් වැය විෂයක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් ද අනෙක් වැය විෂයය සඳහා පරිපූරක මඟින් සලසා ගෙන තිබූ රු. මිලියන 1.5 ඇතුළුව මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සියයට 100 ක් ඉතුරු වී තිබුණි.	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ මුදල් අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයන්හී පරිහරණය සඳහා සාකච්ඡා මේසයක්, ඡායා පිටපත් යන්ත්‍රයක් හා වායු සමීකරණ යන්ත්‍රයක්, කැමරා උපකරණ ආදී උපකරණ ලබා දෙන මෙන් ඉල්ලීම් ඉදිරිපත් වූ බැවින් මේ සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලූම් කල අතර ජනාධිපතිවරණයෙන් පසුව ආණ්ඩුව වෙනස් වීම මත ඇතැම් උපකරණ මිලදී ගැනීම් සිදු නොකළ බැවින් ප්‍රතිපාදන ඉතිරි වීම.	-එම -

3.2 අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වන වැඩ සටහන් හා වෙනත් රාජ්‍ය ආයතන වෙත ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා වෙන් කර දෙන ලද ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තිරසර සංවර්ධන සභාව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිත ආයතනය, රජයට අයත් ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය හා බදු අභියාචනා කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතන හා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ පවතින වැඩසටහන් වල වැය විෂයයන් 09ක් වෙනුවෙන් වියදම් දැරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කර තිබූ එකතුව රු.මිලියන 48ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 47 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 58-100 දක්වා සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණු අතර වැය විෂයයන් 07 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම එනම් සියයට 100 යක්ම ඉතිරි වී තිබුණි. .	වෙනත් මූලාශ්‍ර මඟින් මූල්‍යමය සහ මූල්‍යමය නොවන දායකත්වයන් ලැබීම, වර්ෂය තුල සැලසුම් කල පරිදි සේවක බඳවා ගැනීම් සිදු කල නොහැකිවීම, අපේක්ෂිත වියදම් ඇති නොවීම සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව වියදම් අවම කිරීම සඳහා උචිත වියදම් පාලන ක්‍රමවේද යොදා ගැනීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ප්‍රතිපාදන ප්‍රසස්ථ ලෙස සැලසුම් කිරීමට හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබූ රජයට අයත් ප්‍රතිව්‍යුගතකරණ ඒකකය, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය	වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබූ ව්‍යාපෘති, වැඩසටහන් හා ඒකක වල වැය විෂයන් 4 ක් සඳහා එකතුව රු.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කළ යුතු

සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩ සටහන (ADB) යන ව්‍යාපෘති හා වැඩසටහන්වල වැය විෂයයන් 4ක් සඳහා එකතුව රු.මිලියන 956 ක් පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ එක් වැය විෂයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. මිලියන 430ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, රු. මිලියන 375 ක් ඉතිරි වී තිබුණි.එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 87 ක් විය.	මිලියන 956 ක් පරිපූරක වීම. ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර ලෝක බැංකුව විසින් සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1.4 ක් වෙන් කර තිබුණු අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 430 ක් වෙන් කර ඇත. 2024 වර්ෂය තුළ මැතිවරණ දෙකක් ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ප්‍රසම්පාදනයන් වර්ෂය තුල අවසන් නොවීම නිසා ගෙවීම් සිදු නොවීමෙන් මෙම ඉතිරිය සිදුවී තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			**ප්‍රධාන ගණන්දීමේ**	**නිර්දේශය**
	නීති,රීති රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**	**නිලධාරීගේ අදහස් දැක්වීම**	
(අ)	ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1647 (ඉ) හා 2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය		අමාත්‍යාංශය සතු සියළුම වාහන පිළිබඳව විස්තර ඇතුළත් විධිමත් වාහන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	ලියාපදිංචි අංකය, වර්ගය,මාදිලිය අතුලත් විධිමත් ලේඛණයක් මේවන විට සකස් කරමින් පවතී.	මුදල් රෙගුලාසි සංග්‍රහය හා වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින්		(i) වාර්ෂික වාර්තා ත්‍රෛභාෂාවෙන් සකස් කර අදාල වර්ෂය අවසන් වී මාස 05 ගත වීමට පෙර සභාගත කිරීම	2021 වර්ෂය සඳහා 2021.11.16 දින සිට 01/2021 දරණ ව්‍යාපාර චක්‍ර ලේඛයේ පරිදි කාල ප්‍රමාදයකින් යුතුව ඉදිරිපත්	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් දීම.

හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය	සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවත් 2021 සිට 2023 දක්වා වර්ෂවලට අදාළව අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍යය ව්‍යවසායන් 18 ක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සඳහා අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට මාස 01-26 දක්වා කාල ප්‍රමාදයක් ගෙන තිබුණි.	කර ඇත. ඒ පිළිබඳ මෙම අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ව්‍යවසායන් වරින් වර ලිපි මඟින් දැනුවත් කළ ද අමාත්‍යාංශය වෙත වාර්ෂික වාර්තා ප්‍රමාද වී ඉදිරිපත් කර ඇත. නමුත් රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ 2021 සහ 2022 වාර්ෂික වාර්තා නිසි පරිදි නියමිත දිනට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. 2022 සහ 2023 වාර්ෂික වාර්තා නියමිත දිනට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස ලිපි මඟින් අදාළ ආයතන දැනුවත් කර ඇත.	
	(ii) 2021 සිට 2023 වර්ෂවලට අදාලව අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍යය ව්‍යවසායන් 12 ක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරිම සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.		-එම-

(ඇ)	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය	මිලියන 7,750	(i)	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-11 ට අනුව, වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය (මුදල් අමාත්‍යාංශය) වෙනුවෙන් දරන ලද වියදම රු.මිලියන 69,784 ක් වුවද, අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයේ එම වියදම රු.මිලියන 62,034 ක් ලෙස දක්වා තිබීමෙන් ඒ අතර රු.මිලියන 7,750 ක වෙනසක් නිරීක්ෂණය විය.	අංක 102-1-2-40-1501-33 දරන වැය විෂය යටතේ 2024 මැයි මාසයට අදාල රු. මිලියන 7,748ක වියදමක් සහ බදු අභියාචනා කොමිෂන් සභාව 2024 මාර්තු මාසයට අදාල වැය විෂය කිහිපයක රු.මිලියන 1.5 ක් යන වට්නාකම්වලින් යුත් වියදම් CIGAS ගිණුම් ප්‍රකාශ හරහා භාණ්ඩාගාර මුද්‍රිත වලට එම මාස වලදී ඇතුලත් වී නොමැත. එබැවින් එය ජර්නල් සටහන් ඉදිරිපත් කරමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් භාණ්ඩාගාර මුද්‍රිත වලට ඇතුලත් කරන ලදී. මෙම අමාත්‍යාංශයේ අග්‍රිම මගින් දරණ ලද වියදම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර මුද්‍රිත වලට ඇතුලත් කරන ලද බැවින් SA 11 ඇතුලත් වී ඇත. එම වියදම වෙනත් දෙපාර්තමේන්තු විසින් මෙම අමාත්‍යාංශය වෙනුවෙන් කරන ලද වියදමක් ලෙස සටහන් SA 11 සටහන් වුවත් එය සත්‍ය ලෙසම මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති අග්‍රිම ගිණුම හරහා කල වියදමක් බැවින් අග්‍රිම ගැලපුම් ගිණුමෙන් ඉවත් කර ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
		මිලියන 7,750	(ii)	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-11 ට අනුව, වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය (මුදල් අමාත්‍යාංශය) වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශනය ඒසීඒ-2(ii) ට අනුව	ඉහත සටහන් වල සඳහන් පරිදි මෙම අඩුපාඩුව සිදු වී ඇත.	- එම -

		මු.රෙ.208 යටතේ වියදමට සමාන විය යුතුය. කෙසේ වෙතත් පිළිවෙලින් එම ශේෂයන් රු.මිලියන 69,784 ක් හා රු.මිලියන 62,034 ක් ලෙස දැක්වීමෙන් රු.මිලියන 7,750 ක වෙනසක් නිරීක්ෂණය විය.		
රු. 246,896	(iii)	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-51 ට අනුව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද හර කිරීම් රු.මිලියන 1.8 ක් වුවත් අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයට අනුව එය රු.මිලියන 1.5 ක් ලෙස දක්වා තිබීමෙන් ඒ අතර රු.246,896 ක වෙනසක් නිරීක්ෂණය විය.	බදු අභියාචනා කොමිෂන් සභාව 2024 මාර්තු මාසයට අදාලව රු.246,896 ක රජයේ නිලධාරීන් වෙත ලබා දෙනු ලැබූ අත්තිකාරම් මුදල් CIGAS ගිණුම් ප්‍රකාශ හරහා භාණ්ඩාගාර මුද්‍රිත වලට ඇතුලත් වී නොමැත. එබැවින් එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර මුද්‍රිත වලට ඇතුලත් කරන ලදී. මෙම අමාත්‍යාංශයේ අග්‍රිම මගින් දරණ ලද වියදම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර මුද්‍රිත වලට ඇතුලත් කරන ලද බැවින් SA 51 කට ඇතුලත් වී තිබුණ ද, එය සත්‍ය ලෙසම මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති අග්‍රිම ගිණුම හරහා කල වියදමක් බැවින් අග්‍රිම ගැලපුම් ගිණුමෙන් ඉවත් කර ඇත.	- එම -

3.4 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මු.රෙ 571(2) හා (3) ඡේදයෙහි විධි විධානවලට යටත්ව කල් ඉකුත් වූ සියළුම තැන්පතු රජයේ ආදායමට බැර කල යුතු වුවත් දෙසැම්බර් 31 දිනට	මෙම තැන්පතු මුදල් අමාත්‍යාංශයේ කාර්යයන් ඉටු කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගේ රැඳවුම් මුදල් වේ. මෙම රැඳවුම්	මු.රෙ 571(2) හා (3) ඡේදයෙහි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු

වර්ෂ 2-5 ත් අතර පැවැති මිලියන 36ක් හා වර්ෂ 5 ට වැඩි මිලියන 22 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් මේ දක්වා ඉල්ලුම් කර නොමැති බැවින් තවදුරටත් පොදු තැන්පත් ගිණුමේ ඇත. කෙසේ වුවත් අදාල කොන්ත්‍රාත් කරුවන් දැනුවත් කර මෙම රැඳවුම් මුදල් සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් දැනුම් දෙමි.	බව.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

(අ) **රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය**

රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක් පිහිටුවා 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණ සිදුකෙරේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ 02 වන මූලධර්මයෙහි සඳහන් පරිදි, පාලක සමාගමක් පිහිටුවීම හා 2023 මැයි මස 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් අංක MF/036/CM/2023/107 හා 2023 මැයි 08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඡේද 4.2 හා 4.3 සහ ඇමුණුම 02 හා 03 අනුව, ලැයිස්තුගත කර ඇති ආයතන 72 ක්, ප්‍රතිව්‍යුහගතකරණය සඳහා පාලක සමාගමේ අනුබද්ධිත සමාගම් ලෙස පැවරීමට තීරණයකර තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වූ පාලක සමාගම ස්ථාපිත කර නොතිබුණි.	පාලක සමාගම පිහිටුවීම සිදුකළ හැකිව තිබුණේ රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණ සම්බන්ධයෙන් වූ නව පනත හඳුන්වාදීමෙන් අනතුරුව එම පනතෙහි ඇතුළත් විය යුතුව තිබූ ප්‍රතිපාදන අනුව වේ. නමුත් මීට පෙර රජය පැවති කාලය තුළ එම පනත සම්මත කරගැනීමට අවස්ථාවක් නොලැබූ බැවින් පාලක සමාගම පිහිටුවීම සිදුකළ නොහැකි වී ඇත.	රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ සඳහන් ආකාරයට කටයුතු කිරීමට හෝ ඊට උචිත සංශෝධන විධිමත්ව ගෙන ඒමට හා ඒ අනුව කටයුතු කළ යුතු වීම.
(ii)	එම පාලක සමාගම වෙත පවරාගෙන, ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ සංදේශයේ ඇමුණුම 01 ලැයිස්තුවේ සඳහන්, ආයතන 08 ක් පාලක සමාගම වෙත	රාජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකිරීමේ ඒකකය මූලික ලෙස හඳුනාගත් ආයතන 08 ක ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු කළ අතර ඉන් බොහෝමයක්	- එම -

	පවරා ගැනීමකින් තොරව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් තෝරාගෙන ඔවුන්ගේ සහාය යටතේ මෙම ආයතන සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබුණි. ඒ අනුව, තෝරාගත් ආයතන 08 න් ආයතන 07 ක් සඳහා ගණුදෙනු උපදේශකවරු පත්කිරීම සඳහා 2023 වර්ෂයේ අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ගණුදෙනු උපදේශකවරුන් වශයෙන් ගිවිසුම්ගත වූ විදේශීය ආයතන දෙකක් සඳහා අමාත්‍යාංශයේ අංක 18/62P දරන පොදු තැන්පත් ගිණුමෙන් රු.මිලියන 193 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි	2024 අගෝස්තු මස වන විට අවසන් අදියරේ පැවතුණි. නමුත් නව රජය මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් යළි සලකා බලමින් සිටින අතර පෙර ව්‍යාපෘති අතරින් "ග්‍රෑන්ඩ් හයට්" හෝටලය ප්‍රතිව්‍යුහගත කිරීම ඉදිරියට කරගෙන යෑමට වෙන විට අනුමැතිය ලැබී ඇත.	
(iii)	අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ වුවද, පළමු අදියරයේදී බැහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා තෝරාගත් ආයතන 08 න් ආයතන 04 ක් 2022 සහ 2023 වර්ෂයන්හිදි බදු පෙර ලාභයක් උපයා තිබූ ආයතන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, මෙම ආයතන සඳහා භාණ්ඩාගාරය වෙතින් මූල්‍ය දායකත්වයක් ලබාදී නොතිබූ අතර අංක MF/052/CM/2022/177 හා 2022 අගෝස්තු 31 දිනැති අමාත්‍යමණ්ඩල සංදේශයේ 4 ඡේදයේ (i) ප්‍රකාරව, මෙම ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සම්බන්ධයෙන් සිදුකල අධ්‍යන වාර්තාවන්හි අඩංගු තොරතුරු පිළිබඳව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	පැවති රජයේ ආර්ථික ප්‍රතිපත්තීන්ට අනුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආයතන 08 ක් හඳුනාගෙන තිබූ අතර ලාභ ලැබීම හෝ නොලැබීම ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතුය යන තීරණය ගැනීම සඳහා බලපාන සාධකය නොවන බව පෙන්වා දෙමි.	අමාත්‍ය මණ්ඩල සංදේශයන්හි විස්තර කර ඇති පරිදි අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ බව සඳහන් ව ඇති බැවින් ප්‍රතිව්‍යුහගතකරණයේ දී එම සාධකයද සලකා බැලිය යුතු බව සහ එසේ නොවන්නේ නම් ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු සඳහා බලපා ඇති අනෙකුත් සාධක පැහැදිලිව හෙළිදරව් කළ යුතු බව.
(iv)	2023 සහ 2024 යන වර්ෂයන් දෙක සඳහා රාජ්‍ය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් එකතුව රු.මිලියන 121 වැයකර තිබූ	අදහස් දක්වා නොමැත.	අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම

අතර එයින් රු. මිලියන 58 ක් හෙවත් මුළු පරිපාලන වියදමින් සියයට 48 ක් එම ඒකකයේ වැටුප් ගෙවීම වෙනුවෙන් වැය කර තිබුණි. කෙසේ වුවද, විගණනය වෙත ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ (SOE) කටයුතු 2025 පෙබරවාරි මාසයේදී තාවකාලිකව අත්හිටුවා තිබුණි. ඒ අනුව, මෙම ඒකකය පිහිටුවීමේ අරමුණු ඉටුකරගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් නොහැකිවී තිබූ අතර ගණුදෙනු උපදේශකවරුන්ට ගෙවීම සඳහා සහ ඒකකය පවත්වාගෙන යාම සඳහා දරා තිබූ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය.		මූලික අරමුණ කර ගනිමින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පිහිටුවන ලද මෙම ඒකකයේ කාර්යයන්හි ඵලදායීතාවක් ලබා ගත හැකි වන පරිදි කඩිනමින් කටයුතු කළ යුතු වීම.

(ආ) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිතායතනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 සැප්තැම්බර් 13 දින අනුමත කල අංක MF/051/CM/2022/176 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ පරිදි රාජ්‍ය සේවා කාර්යක්ෂමව ඉටු කිරීමත් හා ආයෝජන දිරිමත් කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයෙන් යුත් ආකෘතිය මඟින් ක්‍රමවේදයක් හඳුන්වාදීම අරමුණු කර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිව නියෝජිතායතනය පිහිටුවා තිබුණි. 2024 ඔක්තෝබර් 31 දින වනවිට මෙම නියෝජිතායතනය විසින් 2023 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 12 ක් ඇතුළුව ව්‍යාපෘති 14 ක් මෙම ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබූ අතර 2024 සැප්තැම්බර් 30 මේ ක්‍රමය යටතේ තවදුරටත් ව්‍යාපෘති 72 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැයිස්තුගත කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නියෝජිතායතනය ස්ථාපිත කර වර්ෂ දෙකක් ගත වුවද, ඊට අදාල, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන සඳහා වූ පනත විධිමත්	පෞද්ගලික හවුල්කාරිත්වය වැඩසටහනේ නෛතික රාමුව අනුමත වන තෙක් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා 'Guidelines on Government Tender Procedure - Part II' සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක '02/ 2019' උපයෝගී කරගනු ලබන බවත් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පනත සම්බන්ධයෙන් අලුතින් පත් කරන ලද කැබිනට් මණ්ඩලය විසින් හිටපු අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට අදහස් කරන්නේ ද යන්න නීති කෙටුම්පත් ආයතනයෙන් උපදෙස් ඉල්ලා සිටින ලිපියේ පිටපතක් රාජ්‍ය ,පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික නියෝජිතායතනය වෙත ලැබිණි. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව	පනත් කෙටුම් පත සම්මත කර ගැනීමට හෝ උචිත විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියා කිරීම කඩිනම් කල යුතු බව.

පරිදි ස්ථාපිත නොවීම හේතුවෙන් දැනට මෙම ක්‍රමය යටතේ හඳුනාගෙන ආරම්භකර ඇති ව්‍යාපෘති හා ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නිශ්චිත කාලරාමුවකට අනුව අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, විගණනය වෙත ලද තොරතුරු අනුව, මෙම ඒකකයේ කටයුතු 2025පෙබරවාරි 25 දින වන විට තාවකාලිකව අත්හිටුවා තිබුණි. ඒ අනුව, 2023 සහ 2024 වර්ෂයන් සඳහා මෙම ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් දරා තිබූ රු.මිලියන 31 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය.

පනතේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයින් සහ මුදල් අමාත්‍යාංශ නිලධාරීන් අතර සාකච්ඡාවක් පැවැත්වූ බවත් මෙහිදී මූල්‍ය කළමනාකරණ පනතට සමගාමීව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පනතට විධිවිධාන ඇතුලත් කිරීමේ අවශ්‍යතාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් අවධාරණය කල බවත් එමෙන්ම සංවර්ධන හවුල්කරුවන් සමඟ වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පනතේ කෙටුම්පත ඉල්ලා ඇත.

4.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දේශීය අරමුදල් උපයෝජනයෙන් ක්‍රියාත්මක වූ අන්තර් භාණ්ඩාගාර කළමනාකරණ හා තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ වැය විෂයයන් 02 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.මිලියන 588 කින් රු.මිලියන 541 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 47 සිට සියයට 94 දක්වා වූ සැලකිය යුතු පරාසයක් විය.	2024 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු කිරීමේදී පද්ධතියේ ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය අතිරේක පරිශීලක බලපත්‍ර මිලදී ගැනීම සඳහා රු. මිලියන 420ක මුදලක් ඇස්තමේන්තු කරන ලද නමුත් අමාත්‍යාංශය අදාළ කොන්ත්‍රාත්කරු සමග කල සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් ලෙස ඉහත පරිශීලක බලපත්‍ර කිසිදු අතිරේක ගෙවීමකින් තොරව ලබා ගැනීමට හැකියාව ලැබිණ. පද්ධතියේ ව්‍යාප්ති කටයුතු කොන්ත්‍රාත්කරුගේ විශාල මැදිහත්වීමකින් තොරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය විසින්ම සිදුකර ගැනීමට හැකිවීම නිසාවෙන් ඇස්තමේන්තුගත මුදල වියදම් කිරීම අවශ්‍ය නොවීය.	ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර පවතින පරිසර තත්ත්වය පිළිබඳ විධිමත්ව අධ්‍යන කිරීමටත්, අදාල පාර්ශව සමඟ විධිමත් එකඟතාවයකට පැමිණීම අවශ්‍ය වීම.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) 2024 පෙබරවාරි 20 සිට 2025 පෙබරවාරි 19 දක්වා වසරක කාලයක් සඳහා පවිත්‍රතා සේවාව සඳහා වූ ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 පෙබරවාරි 20 සිට 2025 පෙබරවාරි 19 දක්වා වසරක කාලයක් සඳහා අමාත්‍යාංශයේ පවිත්‍රතා සේවාව ඉටුකිරීමට මීට පෙර පවිත්‍රතා සේවාව ඉටුකල පුද්ගලික සමාගම සමඟ වසරක කාලයක් සඳහා රු.මිලියන 35 ක (බදු රහිත) මුදලකට ගිවිසුමකට එළඹී තිබුණි. ගිවිසගත් පරිදි නියමිත සේවක සංඛ්‍යාව දෛනික පවිත්‍රතා කටයුතු සඳහා නොයෙදවීම හේතුවෙන් අමාත්‍යාංශය විසින් එම ගිවිසුම අවලංගු කර තිබූ අතර අයවිය යුතු කිසිවක් නොමැති බව සඳහන් කරමින් කාර්යසාධන සුරක්ෂණය වූ රු.මිලියන 1.7 ක් සම්පූර්ණයෙන් නිදහස් කර තිබුණි. දෙවැනි වරට තෝරාගෙන තිබූ පුද්ගලික සමාගමද ගිවිසුම්ගත පරිදි සේවක සංඛ්‍යාව සැපයීමට අපොහොසත් වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (2006) 3:12:2 (11) ප්‍රකාරව පූර්ව සුදුසුකම් පරික්ෂා කර අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට තාක්ෂණික ඇගයීම් කමිටු විසින් නිවැරදි නිගමනයකට නොපැමිණීම හේතුවෙන් මෙවැනි තත්වයන් ඇති වන බව නිරීක්ෂණය විය. ඉහත අවස්ථා දෙකේදීම පවිත්‍රතා කටයුතු වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.341,897 ක් වැය කර තිබුණි.	පවිත්‍රතා සේවාව සඳහා ලංසු කැඳවන ලද අවස්ථාවේදී ආයතන 04 ක් විසින් ලංසු ලේඛන ඉදිරිපත් කර තිබුණි. ලංසු ඉදිරිපත් කල ආයතන 4 විසින්ම පඩිපාලක සහා ආඥා පනත අනුව කම්කරුවෙකු සඳහා දිනකට රු. 600 ක්ද වැඩ පරීක්ෂකවරයෙකු සඳහා රු. 700 ක්ද ගෙවන බව සඳහන් කරමින් ලංසු ලේඛන ඉදිරිපත් කර තිබුණි. මෙම වැටුපට අනුව වයස අවුරුදු 60 ට අඩු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් හෙබි පුද්ගලයින් මෙම සේවය සඳහා යොදවා ගැනීම අපහසු බව නිරීක්ෂණය විය. එම හේතු මත දෙපාර්ශවය විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පවත්නා තත්ත්වය තේරුම් ගැනීමෙන් පසු ගිවිසුම්ගත කාල සීමාව තුළ අමාත්‍යාංශ පරිශ්‍රයේ චංචල හා නිශ්චල දේපල සහ වත්කම් වලට කිසිදු හානියක් සිදු වී නොතිබුණු බැවින් කර්මාන්තයේ ස්වභාවය සැලකිල්ලට ගෙන කාර්ය සාධන සුරක්ෂණය නිදහස් කර ඇත. එමෙන්ම අවස්ථා කිහිපයකදීම සේවකයිනගේ පැමිණීම අවම මට්ටමක පවතින බව දැනට පවිත්‍රතා සේවාව ඉටුකරන පෞද්ගලික සමාගම දැනුවත් කර ඇති අතර, 2025.04.25 දිනට පෙර ගිවිසුම ප්‍රකාරව පවිත්‍රතා සේවකයින්ගේ පැමිණීම නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස ලිඛිතව දන්වා ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කල යුතු බව හා සේවාවේ ගුණාත්මක භාවය පවත්වාගෙන යාම සඳහා අවම සේවක සංඛ්‍යාවක් දෛනිකව සේවයේ යෙදවීමට අදාල සමාගම වෙත උපදෙස් සැපයීම කල යුතු වේ.

(ආ) මහා භාණ්ඩාගාර ගොඩනැගිලි දෙකෙහි ස්ථාපිත විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතිය හා එයට අයත් උපාංග නඩත්තු කිරීම

මහා භාණ්ඩාගාර ගොඩනැගිලි දෙකෙහි ස්ථාපිත (Electronic Access Control System) විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතිය රු.මිලියන 17 ක මුදලකට පෞද්ගලික ආයතනයක් විසින් ස්ථාපිත කර තිබූ අතර, 2017 දෙසැම්බර් 19 දින මෙම පද්ධතිය අමාත්‍යාංශයට භාර දී තිබුණි. වර්ෂ 03 ක වගකීම් කාලය 2020 දෙසැම්බර් 18 දින අවසන් වී තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණ සිදුකෙරේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 (ඇ) ප්‍රකාරව, අවස්ථානුගත කරුණු යටතේ පමණක් සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට භාණ්ඩ හෝ සේවා හෝ වැඩ ප්‍රසම්පාදන ප්‍රදානය කිරීම කළ යුතුය. එසේ වුවද, වගකීම් කාලය අවසන් වීමෙන් පසු එළඹි වර්ෂ 4 ක කාලයන් සඳහා ඉහත පද්ධතියේ හා එයට අයත් උපාංග නඩත්තු කිරීම ඉහත ආයතනය ලවා සිදු කර ගැනීම වෙනුවෙන් එකතුව රු.මිලියන 4.3 ක් (බදු රහිත) ගෙවා තිබුණි. ඒ අනුව සාධාරණීකරණය කිරීමකින් තොරව අඛණ්ඩව වසර 4 ක් සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව ඉහත ආයතනයෙන් සේවා කටයුතු සිදු කරගෙන තිබුණි.	මහා භාණ්ඩාගාර ගොඩනැගිලි දෙකෙහි ස්ථාපිත විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතිය ස්ථාපිත කරන ලද පෞද්ගලික ආයතනය විසින් එය ස්ථාපිත කරන ලද 2017.12.19 දින සිට වසර 03ක් දක්වා වගකීම් කාලය තුල සේවා කිරීම සිදු කරන ලදී. ඉන් පසු 2021 වර්ෂයේ සිට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 (ඇ) ප්‍රකාරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ගනු ලැබූ ප්‍රසම්පාදන තීරණ මත අදාල පෞද්ගලික ආයතනය මගින් සේවා කිරීම සිදු කර ගන්නා ලදී. එසේ එම ආයතනය මගින්ම සේවා කටයුතු සිදු කිරීමට හේතු පාදක වී තිබුනේ විද්‍යුත් ප්‍රවේශ පාලන පද්ධතිය, මෘදුකාංග, මුරපද හා දත්ත පද්ධති මෙම ආයතනය මගින් නඩත්තු කිරීමත් එම දත්ත තවත් පාර්ශවයත් වෙත නිරාවරණය වීම හේතුවෙන් සිදුවිය හැකි අහිතකර තත්ත්වන් වලක්වා ගැනීම සඳහාත්ය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු බව.
(ii)	විද්‍යුත් ප්‍රවේශ පද්ධතිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මුද්‍රණය කරන ලද මුළු කාඩ්පත් ප්‍රමාණය පිළිබඳ තහවුරුකරන ලද තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර ලබාගත හැකිව පැවති තොරතුරු අනුව, 2024 මාර්තු මාසයේ කාඩ් 50 ක්ද, 2023 වර්ෂයේ අවස්ථා දෙකකදී කාඩ්පත් 300 ක් ද සඳහා එකතුව	ඉදිරියේදී කාඩ්පත් මිලදී ගැනීමේදී මෙම මිල ගණන් විගණන ඡේදයේ දක්වා ඇති පරිදි අනෙකුත් රාජ්‍ය ආයතන සමග සැසඳීමක් සිදු කර මිලදී ගැනීමට කටයුතු කරන බව දන්වමි.	වියදම් දැරීමට හෝ එකී වියදම් වඩා සාධාරණ දැයි තහවුරු කිරීම සඳහා සෑම විට ම සියළුම උත්සාහයන් ගත යුතු බව.

රු.මිලියන 1.3 (වැට් සහ සේවා බද්ද ඇතුළත්ව) ගෙවා තිබුණි. මේ අනුව එක් කාඩ්පතක් සඳහා රු.3,334 සිට රු.4,462 ක පමණ මුදලක් අමාත්‍යාංශය මඟින් වැයකර තිබූ අතර කාඩ්පත් මුද්‍රණය සඳහා දරනු ලබන වියදම් සලකා බැලීමේදී, මෙවැනි පද්ධති භාවිතා කරනු ලබන වෙනත් රාජ්‍ය ආයතනවල කාඩ්පත් මුද්‍රණ වියදම් පිළිබඳව සැසඳීමක් සිදු කර සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බවට තහවුරු නොවුණි.

4.4 කළමනාකරණ දූර්වලතා

බදු අභියාචනා කොමිෂන් සභාව

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශීර්ෂය-102 මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ I වැඩ සටහනේ ව්‍යාපෘතිය 5 යටතේ, බදු අභියචනා කොමිෂන් සභාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂිකව වෙන් කර තිබූ එකතුව රු.මිලියන 105 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 98 වියදම් කර තිබුණි. 2025 ජනවාරි 31 දින වනවිට බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති එහෙත් විසඳා අවසන් නොවූ අභියාචනා 506ක් පැවති අතර ඊට අදාල බදු වටිනාකම රු.මිලියන 110,395 ක් වී තිබුණි. මේ තුළ රු. බිලියනය ඉක්මවූ එකතුව රු.මිලියන 70,494 ක් වූ අභියාචනා 29 ක් හා රු.මිලියන 100 ත් 1000 ත් අතර එකතුව රු.මිලියන 33,096 ක් වූ අභියාචනා 107 ක් ඇතුළත්වී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ලියාපදිංචි වී තිබුණද කිසිඳු විභාග කිරීමක් ආරම්භ කර නොතිබූ බදු වටිනාකම රු.මිලියන 3,408 ක්වූ අභියාචනා 27ක් හා විභාග කිරීම ආරම්භ කර ඇතත් නිශ්චයන් ලබා දී නොතිබු එකතුව රු.මිලියන 106,990 ක් වූ අභියාචනා 483 ඇතුළත්වී තිබුණි. තවද, 2022 වර්ෂයේ සිට 2025 ජනවාරි 28 දින දක්වා අභියාචනා විභාග	2011 මැයි මස බදු අභියාචනා කොමිසම ස්ථාපිත වූ අතර අභියාචනා විමසිම් කටයුතු ආරම්භ වි ඇත්තේ 2012 මාර්තු මාසයේ සිටය. කොමිසම ස්ථාපිත කිරීමට පෙර පැවති අභියාචනා ක්‍රියාවලිය යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැවති සමාලෝචන මණ්ඩලයෙන් (Board of Review) භාරගත් අභියාචනා 71ක් විමසීම් කටයුතු සඳහා මෙම කොමිෂන් සභාවට පවරා තිබුණි. 2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනතේ සාමාජිකයන් තිදෙනෙකු බැගින් වූ එක් විනිශ්චය සභාවක් පවත්වා ගෙන යන ලදි. 2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනත 2013 දී සිදු වූ සංශෝධනයට අනුව විනිශ්චය සභා මණ්ඩල තුනක් පවත්වා ගෙන යාමට ප්‍රතිපාදන සලසා තිබුනද, 2019 වර්ෂය දක්වාම සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් එක් විනිශ්චය සභාවක් වශයෙන් කොමිෂන් සභාව ක්‍රියාත්මක වී ඇත. එකී කාලය තුලද, 2019 සිට 2022 දක්වා තුන් අවුරුදු කාල සීමාව	බදු අභියාචනා සම්බන්ධව කටයුතු කඩිනම් කර එහි තීන්දු අනුව හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.

කිරීම අවසන් වුවත්, අවසන් නිශ්චය ලබා දී නොමැති වූ ‘Reserved Cases’ 233 ක් පැවැති අතර ඊට අදාළ බදු මුදලෙහි වටිනාකම රු.මිලියන 36,514 ක් වී තිබුණි. මෙසේ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ කටයුතු දීර්ඝ කාලයක් නිම වී නොතිබීමෙන් කොමිෂන් සභාවේ තීන්දු අනුව, රජයට අයකරගත හැකිව තිබිය හැකි අදායම් එකතුකර ගැනීමේ සැළකියයුතු ප්‍රමාදයක් සිදුවන බව හා ඒ හේතුවෙන් රජයට අනවශ්‍ය ඍජු හා වක්‍ර පිරිවැයක් දැරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.	අවසානයේදී නව සාමාජිකයින් පත් කිරීම නිසි පරිදි සිදුවී නොමැතිවීම හේතුවෙන් අභියාචනා විමසීම් කටයුතු ද අඛණ්ඩව සිදු වී නොමැත.

5. මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දින වන විට අනුමත තනතුරු 403 ක් වූ අතර ඉන් තනතුරු 104 ක් හෙවත් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 26 ක් පුරප්පාඩු වී පැවතිණි. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි ඍජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 20 ක් ද, තෘතීයික මට්ටමේ 01 ක් තනතුරක් ද හා ද්විතීයික මට්ටමේ තනතුරු 48 ක් ද ඒ අතර විය.	වාර්ෂික ස්ථාන මාරු, වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ අනුයුක්ත කිරීම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදුකරන අතර නව බඳවා ගැනීම් යටතේ අනුයුක්ත කරන නිලධාරීන් හා සේවා අවශ්‍යතාව මත අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කරන අනුයුක්ත කිරීම් මඟින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදු කරන අතර, පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පත් කිරීමේ බලධාරීන් දැනුවත් කර ඇත. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.01.08 හා 2025.02.13 දිනැති කාර්ය මණ්ඩලය අනුමත කිරීමේ ලිපි මඟින් අනුමත තනතුරු සංඛ්‍යාව 359 දක්වා අඩු කර තිබුණි.	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.